# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1966/4 - 2016 මැයි මස 09 වැනි සඳුදා - 2016.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය.*: 3/කටා/ඉ.අත්/77.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4/3/4/2011/ඩී/187.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි,ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

***ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර*:**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දූනගහ පත්තුව සුළු කොට්ඨාශයේ උතුරු කදිරාන ගමේ පිහිටි ගම්පහ ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහතික කරන ලද අංක මු.පී. ගම්. 3906 දරණ පිඹුරේ කැබලි අංක 1 දරණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8133ක් විශාල ඉඹුල්ගස්වාඩියවත්ත නැමති ඉඩම

01. **කැබලි අංකය 01**

ඉඩමේ නම: ඉඹුල්ගස්වාඩියවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 6ක්, තාවකාලික ගොඩනැගිලි 2ක්, වතුර ටැංකියක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.8133.

.ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජූලි මස 11 වැනි දින පෙ.ව. 9.30ට, කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ජූලි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. එච්. එච්. ආර්. කිරිඇල්ල,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2016 මැයි මස 04 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 751

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය.*: නුඑ/3/1/8/අත්පත්/156.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/7/2013/ඩබ්එච්/576.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි,ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

***ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :***

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළයේ සුළු කොට්ඨාසයේ කොඩිගහ (කොට්ඨාස අංක 6 අලුත් කඩවීදිය, නුවරඑළිය) ගමේ පිහිටි


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23412 - 47 - (2016/05)

සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක මු.පි.නු. 3038 හා 2015.10.29 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 ලෙස පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0018ක් පමණ වන ඉඩම් කොටස.

**කැබලි අංක 01**

ඉඩමේ නම: රාවනා වත්ත; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0018.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 මැයි මස 30 වැනි දින පෙ.ව. 10.00ට, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 මැයි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2016 මැයි මස 02 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 752

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය.*: KOLDS/LND/05/ACQ/46.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4/3/9/2012/WS/72.

උක්ත ශීර්ෂය යටතේ 2016 ජනවාරි මස 25 වැනි දින ම විසින් අංක 1951/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති *විශේෂ ගැසට් පත්‍රයේ* අංක 02 - 245 යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි, සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉවත් කළ යුතු දිනයන් | ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන් |
|---|---|
| 2016 පෙබරවාරි 24 | 2016 ජූලි 13 |
| 2016 පෙබරවාරි 17 | 2016 ජූලි 05 |

එස්. එම්. ඩී. සී. සමරසේකර,
ප්‍රාදේශීය ලේකම්,
කොළොන්න.

2016 අප්‍රේල් මස 28 වැනි දින,
කොළොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 753

---

නිවැරදි කිරීමයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

අංක 1118/6 හා 2000.02.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ කැබලි අංක 11ට අදාළ විස්තර පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතුය.

**පළ වී ඇති ආකාරය**

ඉඩමේ නම: මාවතලන්ද; මුල් හිමිකම් කියන අය: ඒ. ඩී. වික්ටර් අප්පුහාමි, 372/1, අංවාරම, මාවනැල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.023.

**නිවැරදි විය යුතු ආකාරය**

ඉඩමේ නම: මාවතලන්ද; මුල් හිමිකම් කියන අය: ඒ. ඩී. වික්ටර් අප්පුහාමි, 372/1, අංවාරම, මාවනැල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0023.

එම්. එම්. පී. ප්‍රියංගනී පෙතන්ගොඩ,
ප්‍රාදේශීය ලේකම්,
මාවනැල්ල.

2016 අප්‍රේල් මස 06 වැනි දින

05 - 766

---

නිවැරදි කිරීමයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

අංක 1120/17 හා 2000.02.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ කැබලි අංක 23ට අදාළ විස්තර පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතුය.

**පළ වී ඇති ආකාරය**

ඉඩමේ නම: බෝගහගොඩ වත්ත; මුල් හිමිකම් කියන අය: මොහොමඩ් ජුනයිදීන් උම්මු නසීනා, 71, නයාවල පාර, මාවනැල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.004.

**නිවැරදි විය යුතු ආකාරය**

ඉඩමේ නම: බෝගහගොඩ වත්ත; මුල් හිමිකම් කියන අය: මොහොමඩ් ජුනයිදීන් උම්මු නසීනා, 71, නයාවල පාර, මාවනැල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0004.

එම්. එම්. පී. ප්‍රියංගනී පෙතන්ගොඩ,
ප්‍රාදේශීය ලේකම්,
මාවනැල්ල.

05 - 767

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.